සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................  ලංකා ඉතිහාසය I  කාලය පැය තුනයි.

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක්වා සමඟ නොගැලපේ. එම නොගැළපෙන නාමය තෝරා එයට අදාළ අංකය දී ඇති හිස්තැනෙහි ලියන්න.**

01. 1. මහවැලි ගඟ  2. අඹන් ගඟ  3. කිරිඳි ඔය  4. කළු ගඟ  5. දැදුරු ඔය (.....)
02. 1. කෝපි  2. සිංකෝනා  3. පොල්  4. රබර්  5. තේ (.....)
03. 1. වංසකතා  2. අටුවා  3. ධර්මග්‍රන්ථ  4. කාසි  5. දිනපොත් (.....)
04. 1. රොබට් නොක්ස්  2. එමර්සන් ටෙනන්ට්  3. ජෝන් ඩොයිලි  4. මේජර් ඩේවි  5. බැල්දියස් (.....)
05. 1. රංකොත් වෙහෙර  2. උත්තරාරාමය  3. පොත්ගුල් විහාරය  4. ලංකාරාමය  5. තිවංක පිළිමගෙය (.....)
06. 1. දීපවංසය  2. සිහලට්ඨකතා මහා වංසය  3. විනයට්ඨකතාව  4. උත්තරවිහාරට්ඨ කතාව  5. පූජාවලිය (.....)
07. 1. හෝපිටිගමුව ලිපිය  2. ගොඩවාය ලිපිය  3. සැස්සේරුව ලිපිය  4. පරමාකන්ද ලිපිය  5. තිඹිරිවැව ලිපිය (.....)
08. 1. මුම්මඩිචෝල මණ්ඩලම්  2. කඳවුරුනුවර  3. කාලිංගපුර  4. ජනනාථ මංගලම්  5. විජයරාජපුර (.....)
09. 1. ගිරිතලේ වැව  2. මින්නේරිය වැව  3. හුරුළුවැව  4. මහකනදරා වැව  5. කවුඩුළු වැව (.....)
10. 1. ථූලත්ථන  2. ඛල්ලාටනාග  3. සද්ධාතිස්ස  4. ලඤ්ජතිස්ස  5. වට්ටගාමිණී අභය (.....)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය තෝරා එයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.**

11. 1. බුද්ධ වර්ෂ - සිදුහත් බෝසතුන්ගේ බුද්ධත්වයත් සමඟ ආරම්භ වේ.
    2. ක්‍රිස්තු පූර්ව - ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියට පෙර යුගයයි.
    3. ශකවර්ෂ - ශක සහ සාතවාහන යුද්ධය ජයගැනීම ආශ්‍රයෙන් ඇරඹේ.
    4. හිජ්රා වර්ෂ - නබි තුමන්ගේ මදීනා නුවර ගමන ඇසුරෙන් ආරම්භ වේ.
    5. ක්‍රිස්තු වර්ෂ - ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියත් සමඟ ආරම්භ වේ. (.....)

12. 1. මල්වතු ඔය - අනුරාධ ගාම
2. කලා ඔය - උරුවේල ගාම
3. ගල්හ නදී - විජිත ගාම
4. කප්පකන්දර නදී- කාචරගාම
5. කල්‍යාණි නදී - කාාණ ගාම (.....)

13. 1. ඩෙමුණ්ඩෝ - ග්‍රීක මූලාශ්‍රය
2. සිල්සිලාත් අල් ත්වාරිං - ඕලන්ද මූලාශ්‍රය
3. පි-චියු-නි වුවාන් - චීන මූලාශ්‍රය
4. පට්ටිනප්පාලෙයි - ඉන්දීය මූලාශ්‍රය
5. එදා හෙළදිව - ඉංග්‍රීසි මූලාශ්‍රය (.....)

14. 1. පණ්ඩුකාභය - ග්‍රාමසීමා ලකුණු කිරීම.
2. මුටසීව රජතුමා - මහමෙවුනා උයන ඉදිකිරීම
3. සූරතිස්ස රජතුමා - සේනගුත්තික ආක්‍රමණය
4. පරාක්‍රමබාහු - බුරුමය ආක්‍රමණය කිරීම.
5. මහානාග යුවරජතුමා - කැළණිය රාජ වංසයේ ආරම්භය (.....)

15. 1. ලීලාවතී - පළමුවන පැරකුම් රජතුමා
2. තිලෝක සුන්දරී - පළමුවන විජයබාහු රජතුමා
3. සුන්දරී මහාදේවී - දෙවන ගජබාහු රජතුමා
4. කල්‍යාණවතී - නිශ්ශංකමල්ල රජතුමා
5. රත්නාවලී - කිත්සිරිමේඝ රජු (.....)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X සහ Y තීරුවේ දී ඇත. එහෙත් Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුව සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දී ඇත්තේ අනු පිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ නිවැරදිව ගලපා නිවැරදි වරණය තෝරා හිස්තැනෙහි ලියන්න.**

| | X | Y |
|---|---|---|
| 16. 1. | කොරවක්ගල සෙල්ලිපිය | A ධාන්‍ය බැංකුවක් පිළිබඳ තොරතුරු |
| 2. | මඩකලපුව කාසි මොටේ ලිපිය | B මැණික් කපන්නන් පිළිබඳ තොරතුරු |
| 3. | ලබු ඇට බැඳිගල ලිපිය | C නන්දිමිත්‍ර යෝධයා පිළිබඳ තොරතුරු |
| 4. | තෝනිගල ලිපිය | D වසභරජු පිළිබඳ තොරතුරු |
| 5. | කෝන්ගල ලිපිය | E වෙළඳශ්‍රේණි පිළිබඳ තොරතුරු |

1. ABCDE 2.BCDEA 3. CDEAB 4. DEABC 5. EABCD (.....)

| | X | Y |
|---|---|---|
| 17. 1. | දඹකොළ පටුන | A කයිට්ස් |
| 2. | ඌරාකොට | B හම්බන්තොට |
| 3. | ගොඩපවත | C වැලිගම |
| 4. | මහාවාලුකාගාම | D හලාවත |
| 5. | සල්වතොට | E කන්කසන්තුරේ |

1. ABCDE 2.BCDEA 3. CDEAB 4. DEABC 5. EABCD (.....)

| | X | Y |
|---|---|---|
| 18. 1. | පණ්ඩුකාභය රජු | A පොළොන්නරුව අගනුවර කරගත් ප්‍රථම දේශීය පාලකයා |
| 2. | වට්ටගාමිණී අභය රජු | B ආර්ය අනාර්ය ජනාවාස ඒකාබද්ධ කිරීම. |
| 3. | පළමුවැනි විජයබාහු රජු | C කාලිංග වංශිකයෙකු වීමනිසා දේශීය විරෝධතාවලට ලක්වීම. |
| 4. | නිශ්ශංකමල්ල රජු | D දක්ඛිණ දේශය මුල්කරගෙන වාරිමාර්ග ක්‍රමයක් ඇති කිරීම |
| 5. | පරාක්‍රමබාහු රජු | E එකවර අභ්‍යන්තර හා බාහිර ආක්‍රමණ දෙකකට මුහුණදීම |

1. AECBD 2. BEACD 3. DCABE 4. ECADB 5. BCEDA (.....)

| | X | Y |
|---|---|---|
| 19. 1. | වෙල්ගම් විහාරය | A දුටුගැමුණු රජතුමා |
| 2. | අභයගිරි විහාරය | B දේවානම්පියතිස්ස රජතුමා |
| 3. | ජේතවන විහාරය | C පළමු පැරකුම් රජතුමා |
| 4. | ලංකාතිලක පිළිමගෙය | D මහාසේන රජතුමා |
| 5. | මිරිසවැටිය | E වලගම්බා රජතුමා |

1. BEDCA 2. EABCD 3. DBACE 4. CABED 5. CDABE (.....)

| | X | Y |
|---|---|---|
| 20. 1. | වැව් බැම්ම | A වැවට ලැබුණ අතිරික්ත ජලය පිටකිරීම. |
| 2. | සොරොව්ව | B වැව්බැම්ම සේදීයාම වැළැක්වීම. |
| 3. | පිටවාන | C වෙනත් ජල ප්‍රභවයකින් වැවට ලැබෙන ජලය වැවට ඇතුල්කිරීම. |
| 4. | රළපනාව | D වැවෙහි ජලය රඳවා තබා ගැනීම. |
| 5. | ඇතුළුවාන | E වැවෙහි ජලය පිටතට ගැනීම. |

1. ABCDE 2. BCDEA 3. CDEAB 4. DEABC 5. EABC (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ යොදන්න.**

21. වංසකතා,
    1. ලංකාවේ පැරණිතම වංසකතාව දීප වංශයයි.
    2. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසය වැදගත්වේ.
    3. ශ්‍රී ලංකාවේ පැරණිතම ඉතිහාසය රචනා සම්ප්‍රදාය වේ.
    4. දික්සඳ සෙනෙවියා පිරිවෙන්වාසී මහානාමහිමියන් විසින් දීපවංශය රචනා කර ඇත.
    5. යම් පුද්ගලයෙකු හෝ වස්තුවක හෝ පරම්පරාවක විස්තර රචනා කර ඇති ග්‍රන්ථ වේ. (.....)

22. පැරණි ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය
    1. මෙරට ජීවත් වූ මුල්ම මානවයා හෝමෝ ඉරෙක්ටස් නමින් හැඳින්වේ.
    2. මෙරට ජීවත්වූ පැරණිතම මානවයා ආසියානු මහද්වීපය හරහා හෝ ඉන්දියානු සාගරය හරහා සංක්‍රමණය වූ බව විශ්වාස කෙරේ.
    3. මානව ගමන් මගෙහි වැඩි කාලයක් ගත කළ යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගය ලෙස හැඳින්වේ.
    4. ප්‍රාග් ඓතිහාසික යුගයත් ඓතිහාසික යුගයත් අතර කාල පරිච්ඡේදය පූර්ව ඓතිහාසික යුගයයි.
    5. අදින් වසර 40 000 කට පමණ පෙර මධ්‍ය ශිලා යුගයක ආරම්භ වේ. (.....)

23. වළගම්බා රජතුමා,
   1. සද්ධාතිස්ස රජතුමාගේ බාලම පුත් කුමාරයා වේ.
   2. බල්ලාඨනාගරජු මරා බලය පැහැරගත් තීය බමුණා පරදවා රාජ්‍යත්වයට පත්විය.
   3. අභිලේඛන වල පිතිමහරජ යනුවෙන් හඳුන්වා ඇත.
   4. සත් ද්‍රවිඩයන් පළවාහැර අනුරාධපුරයේ බලයට පත් වූ රජු තම බිසව වෙනුවෙන් සෝමාරාමය ඉදිකරවන ලදී.
   5. ශාසන ඉතිහාසයේ සඳහන් පළමු පෞද්ගලික ආරාම පූජාව සිදුකළ පාලකයාය. (.....)

24. රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකය,
   1. කෘෂිකර්මාන්තයට මූලිකත්වය හිමිවීම.
   2. හේන් ගොවිතැන ලංකාවේ පැරණිතම වගා ක්‍රමයයි.
   3. ජල සම්පාදන ක්‍රම යටතේ වගා කටයුතු සිදුවීම.
   4. වාරි ජලය ලබාගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය පළමුවරට ලැබුණේ දේවානම්පියතිස්ස රජ්‍ය සමයේදීය.
   5. මෙම යුගයේ වගා කළ ධාන්‍ය වර්ග හා භෝග වර්ග පිළිබඳව තොරතුරු තෝනිගල ලිපියේ සඳහන් වී ඇත. (.....)

25. ශ්‍රී ලංකාවේ චෝළ පාලනය,
   1. අනුරාධපුර රාජධානියේ බිඳවැටීමට චෝළ ආක්‍රමණ හේතු විය.
   2. ක්‍රි.ව. 992 දී පමණ ලංකාවේ රජ රට ප්‍රදේශයේ බලය අල්ලාගත් චෝළයින් පොළොන්නරුව අගනගරය බවටපත්කර ගැනීම.
   3. පාලනය හමුදාමය ස්වරූපයක් ගැනීම.
   4. වෙල්ගම් විහාරයට අනුග්‍රය දැක්වීම.
   5. තන්ජෝරයේ දේවාලය නඩත්තුව සඳහා ලංකාවේ ගම්වර පූජාකිරීම. (.....)

- **ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
  Bසහ C පමණක් නිවැරදි නම් 2 ද,
  C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
  A සහ C පමණක් නිවැරදි නම් 4 ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ලංකාවේ ඉතිහාසය හැඩගැසීම කෙරෙහි බලපෑ දේශගුණ සාධක සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
   A ශ්‍රී ලංකාව නිවර්තන කලාපීය රටකි.
   B ලංකාවට වර්ෂාවලැබෙනප්‍රධාන ක්‍රමය මෝසම් වර්ෂාවයි.
   C නිරිත දිගමෝසම මගින්ලංකාවේ වියළි කලාපයට වර්ෂාව ලැබේ.
   D ලන්දේසි ජාතිකයින්විසින් ශ්‍රී ලංකාවට තේ වගාව හඳුන්වා දෙන ලදී. (.....)

27. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
   A ශ්‍රී ලංකාවේ මුල්ම ආර්ය ජනාවාස තෙත් කලාපයේ ව්‍යාප්ත විය.
   B ආර්යයන් ලංකාවට පැමිණෙන අවදියේ දී ලංකාවේ සංවිධානාත්මක සමාජයක් නොපැවති අතර ආර්ය සංක්‍රමණ හේතුවෙන් සංවිධානාත්මක සමාජයක් ගොඩනගන ලදී.
   C මුල් සංක්‍රමණ සිදුවනඅවධියේ දී ලංකාවේ යක්ෂ, නාග, දේව හා රාක්ෂ වැනි ගෝත්‍රික ජනවර්ග වාසය කර ඇත.
   D ලංකාවට සංක්‍රමණය වූ මුල්ම හා විශාලතම ආර්ය ජන කණ්ඩායම වුයේ විජය කුමරු ඇතුළු හත්සියයක් වූ පිරිසයි. (.....)

28. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
   A අතීත ශ්‍රී ලංකාවේ ජල සම්පාදන ක්‍රම යටතේ වගා කටයුතු සිදුකරන ලදී.
   B වැව් අමුණු ඉදිකිරීම හා අළුත්වැඩියා කටයුතු සිදුකරවීම රජුගේ වගකීමක් වීම.
   C ගංගා හෝ ඇලමාර්ග හරස්කරමින් ගල් වැටි ඉදිකර ඇත.
   D යෝධ ඇළ හෙවත් ජයගග හෙළ වාරි ඉංජිනේරුවරුන්ගේ විශ්මිත නිර්මාණයකි. (.....)

29. එළාර රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත සඳහන්කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
   A ලංකාවට එල්ල වූ පළමු විදේශ ආක්‍රමණය එළාරගේ ආක්‍රමණයයි.
   B අසේල රජු පරදවා එළාර ලංකාවේ සිහසුන අත්පත් කරගන්නා ලදී.
   C එළාර විදේශිකයෙකු උවද ධාර්මික පාලකයෙකු වූ බව මහාවංශයේ සඳහන් තොරතුරු අනුව හෙළිවේ.
   D පළමුවන විජයබාහු රජතුමා විසින් එළාර පලවා හැර ලංකාව එක්සේසත් කරන ලදී. (.....)

30. ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
   A දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේදී ලංකාවට බුදුදහම හඳුන්වා දෙන ලදී.
   B මිහිඳු හිමියන් ඇතුළු ධර්මදූතයන් වහන්සේලා විසින් මහායාන බුදු දහම ලංකාවට හඳුන්වාදීම.
   C බුදු දහම හඳුන්වාදීමට පෙර මෙරට සංවිධානාත්මක ආගමක් නොවීය.
   D බුදුන් වහන්සේගේ ලංකා ගමනය සමගින් මෙරට භික්ෂු ශාසනය ආරම්භ විය. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුර තෝරා එහි අංකය වරහන තුළ යොදන්න.**

31. ''ඉතිහාසය මිනිසාගේ පෞද්ගලික අවබෝධය සඳහා'' යි යනුවෙන් අදහස් දැක්වූ ඉතිහාසඥයා කවුරුන්ද?
   1. ට්‍රෙවිලියන්  2. සෙලර්  3. ජෝන්ජේ  4. කොලින්වුඩ්  5. ක්‍රිස් හර්ට්ස් (.....)

32. එළාර රජුට සහාය දීම සඳහා ආධාරක සේවා රැගෙන පැමිණිය දකුණු ඉන්දීය සෙනෙවියාගේ නම කුමක්ද?
   1. භල්ලුක  2. දීඝජන්තු  3. පුලහත්ත  4. දාඨිය  5. පනයමාර (.....)

33. 'සිහිනැටි වී මිස මුං ඇට නොවපුරනු ඉසා' යනුවෙන් එක් එක් කන්නවල වගා කළ යුතු කන්න පිළිබඳ සඳහන් තොරතුරු සඳහන් ප්‍රසිද්ධ අභිලේඛනය කුමක්ද?
   1. වෙස්සගිරි ලිපිය  2. සිතුල්පව්ව ලිපිය  3. හෝපිටිගමු ලිපිය
   4. තෝනිගල ලිපිය  5. ඇඹුල්ඇඹේ ලිපිය (.....)

34. පොළොන්නරු යුගයේ දී රෝහණයේ පිහිටි අටදහස්රට ප්‍රදේශයේ පාලන මධ්‍යස්ථානය වුයේ කුමක්ද?
   1. මහානාගහුල  2 උදුන්දොර  3. පුංඛගාම  4. කතරගම  5. තම්බලගාම (.....)

35. මහා විහාරය විනාශ කිරීමට මහසෙන් රජු පොළඹවා ගත් මහායානික භික්ෂුව කවරෙක්ද?
1. කුපික්කලතිස්ස 2. සංඝමිත්‍ර 3. බුද්ධඝෝෂ 4. විල්ගම්මුල 5. වජ්‍රබෝධි (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊටඅදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | වැරදිය |
| 2. නිවැරදිය | නිවැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 36 | ගජබාහු රාජ්‍ය සමයේදී පත්තිනි දේවඇදහිල්ල ආරම්භ විය. | මීට වසර 13000කට පමණපෙර කඳුකරය ආශ්‍රිත ප්‍රදේශයේ ජීවත්වූ ප්‍රාග් ඓතිහාසික මානවයා බාර්ලි වගාකොට ආහාරයට පත් බවට සාධක ඇත. (.....) |
| 37 | ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මානවයා බලංගොඩ මානවයා ලෙස හැඳින්වේ. | පූර්ව ඓතිහාසික යුගයේ මානවයා සුසාන ක්‍රමයක් ලෙස ශිලාකේත්‍රක ක්‍රමය භාවිතා කර ඇත. (.....) |
| 38 | මධ්‍යගත පාලනය දුර්වලවීම අනුරාධපුර රාජධානිය බිඳ වැටීමට හේතුවිය. | අනුරාධපුරය රාජධානියඅවසාන සමයේ දී ලාබාල, දුර්වල පස්වන මිහිඳුවැනි පාලකයින් බලයට පත්විය. එමගින් රාජ්‍ය පාලනය බිඳවැටුණු අතර ජනයා මේවා රජයට විරුද්ධව කැරළි ගස්සනට විය. (.....) |
| 39 | පරාක්‍රමබාහු රජුට පසුව ඔහුගේ පුත්‍රයා වූ දෙවනවිජයබාහු කුමරු පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත්විය. | මහසේන රජතුමා විසින් තෝපා, එරමුදු, දුඹුටලු යනවැව් එක්කර මණිගිර වාපික හෙවත් මින්නේරිය වැව ඉදිකරන ලදී. (.....) |
| 40 | වලගම්බා රජතුමා විසින් මාකුල ගාමයේ ආලෝක ලෙනෙහිදී ත්‍රිපිටකට ග්‍රන්ථාරූඪ කළ බව සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන්කර ඇත. | පොළොන්නරු රාජධානිය අවසාන භාගයේදී ලංකාව ආක්‍රමණය කළ රාජ රාජ රජු පරාක්‍රම පාණ්ඩ්‍ය රජු මරා දමා රාජ්‍ය පැහැර ගැනීමත් සමඟ පොළොන්නරුරාජධානිය බිඳ වැටුණි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| | | |
|---|---|---|
| 25 | S | II |

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# ලංකා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) මාතලේ | (ii) පඬුවස්නුවර | (iii) උතුරු පළාත | (iv) ඌරාතොට |
| (v) සලාවත්තොට | (vi) කාචරගාම | (vii) හුරුළුවැව | (viii) ගාල්ල |
| (ix) මිනිහාගල්කන්ද | (x) ගල්ඔය | (xi) මහියංගනය | (xii) ගම්පොළ (ලකුණු 12) |

02. ඉතිහාසය යනු කුමක්ද යන්න,
   (i) ඉතිහාසය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ මත.
   (ii) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන.
   යන මාතෘකා ඔස්සේ විවරණය කරන්න. (ල. 16)

03. ඉතිහාසය හැදෑරීමේදී දෙස් විදෙස් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආලෝකය අතිමහත්ය.
   (i) ලංකා ඉතිහාසය හැදෑරීමේදී වැදගත්වන ඉන්දීය මූලාශ්‍රයන් තුනක් නම් කරන්න. (ල. 3)
   (ii) මහා වංසයේ සඳහන් දේශපාලනික තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් මගින් සනාථවන අවස්ථාවන් පිළිබඳ විස්තර කරන්න. (ල. 6)
   (iii) මූලාශ්‍රයක් වශයෙන් මහා වංසයේ දැකියහැකි දූර්වලතාවයන් පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 7)

04. ශ්‍රී ලංකාව ජනවාස වීම එකවර සිදුවූ ක්‍රියාවක් නොවේ.
   (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ප්‍රධාන අවධි දෙකකට බෙදා වෙන්කර ඇත. ඒ සඳහා පදනම් වු ප්‍රධානතම සාධකය කුමක්ද? (ල. 1)
   (ii) මුල්කාලීන ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රධාන පරිසර කලාප දෙක කුමක්ද? (ල. 2)
   (iii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගයෙන් වෙන්කර හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණනම් කරන්න. (ල. 4)
   (iv) ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය යන්න හඳුන්වා එහි ජනාවාස හා ජීවන රටාවේ විශේෂ ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න. (ල. 9)

05. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් යටතේ එහි ඓතිහාසික වැදගත්කම සාකච්ඡා කරන්න.
   (i) ලංකා ඉතිහාසය හැඩගැසීමේලා ගංගා හා ගංගා නිම්නවල වැදගත්කම.
   (ii) ශ්‍රී ලංකාවේඉතිහාසය හා නාණක මූලාශ්‍රය
   (iii) මධ්‍ය ශිලා යුගයේ ජනාවාස
   (iv) මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්ති (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

06. ශ්‍රී ලංකාවේ මධ්‍යගත දේශපාලන බලයක් ගොඩනැගීම සඳහා පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස හා දුටුගැමුණු යන පාලකයින් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 16)

07. පොළොන්නරු යුගයේ පාලකයින්අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට පවා හේතු වූ බව විද්වතුන්ගේ අදහසයි.

(i) පළමුවන විජයබාහු රජතුමා සබඳතා පැවැත්වූ විදේශීය රටවල් 2ක් නම් කරන්න. (ල. 2)

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ආක්‍රමණය කරන ලද විදේශීය රාජ්‍යන් දෙකක් නම් කරන්න. (ල. 2)

(iii) අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු රජරට බිහිවූ චෝළ ආධිපත්‍යයට විරුද්ධව රුහුණේ නායකත්වය ගෙන කටයුතු කළ විදේශීය කුමාරවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(iv) උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 10)

08. රජ රට ශිෂ්ටාචාරයේ ආර්ථික කටයුතු පිළිබඳ පහත සඳහන් මාතෘකා ඔස්සේ විස්තර කරන්න.

(i) කෘෂිකර්මාන්තය (ii) වෙළෙඳම (iii) කර්මාන්ත (ල. 16)

09. පහත මාතෘකා 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) චෝළ පාලන සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය.

(ii) වළගම්බා රජු මුහුණ දුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය.

(iii) ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපිත කිරීම හා ව්‍යාප්ත වීම.

(iv) අනුරාධපුර රාජධානියේ පරිහාණිය හා බිඳවැටීම. (එක් කොටසකට ලකුණු 8 බැගිනි)


**දෙවන වාර පරීක්ෂණය - 2020**

**ලංකා ඉතිහාසය - 12 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය - 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | - 2 | (11) | - 1 | (21) | - 4 | (31) | - 4 |
| (02) | - 3 | (12) | - 3 | (22) | - 1 | (32) | - 1 |
| (03) | - 4 | (13) | - 2 | (23) | - 2 | (33) | - 1 |
| (04) | - 5 | (14) | - 5 | (24) | - 4 | (34) | - 2 |
| (05) | - 4 | (15) | - 3 | (25) | - 4 | (35) | - 2 |
| (06) | - 5 | (16) | - 3 | (26) | - 1 | (36) | - 2 |
| (07) | - 4 | (17) | - 5 | (27) | - 3 | (37) | - 4 |
| (08) | - 1 | (18) | - 2 | (28) | - 5 | (38) | - 5 |
| (09) | - 1 | (19) | - 1 | (29) | - 2 | (39) | - 3 |
| (10) | - 3 | (20) | - 4 | (30) | - 4 | (40) | - 1 |

## II කොටස



II පත්‍රය
**B කොටස**

02. ඉතිහාසය පිළිබඳ ඉදිරිපත් වී ඇති මත සඳහන් කර විස්තර කිරීම.
ක්‍රිස් හර්ටිස් - මිනිසාගේ අතීතය පිළිබඳ අධ්‍යයනයකි.
ජෝන් ජේ - මානවවර්ගයා අතර සිදුවූ සිදුවීම්වල කතාන්දරය.
සෙලර් - යෙට්මැන් - ඉතිහාසයයනු ඔබේ සිතුවිලි නොව මතකයයි.
ට්‍රෙවිලියන් - ඉතිහාසය යනුවිෂයන් ගණනාවක එකතුවකි.
කොලින් වුඩ් - ඉතිහාසය මිනිසාගේ පෞද්ගලික අවබෝධය සඳහාය.
ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන විස්තර කිරීම.
* තමා ජීවත්වන සමාජය පිළිබඳ යථා අවබෝධය ලැබීම.
* වර්තාමනය හොඳින් අවබෝධ කරගැනීම.
* අතීත අත්දැකීම් මගින් අනාගතය ගොඩනගාගැනීමට අත්දැකීම් ලබාදීම.
* සමාජයේ දේශපාලන බලවේග හඳුනාගැනීමට.
* ජාතික අනන්‍යතාවය හඳුනාගැනීම.
* තමා පිළිබඳ යථා අවබෝධය ලැබීමට.
* ජාතික සමගිය ගොඩනැගීම.
* කාලය හා අවකාශය පිළිබඳ අදහස් වර්ධනය ආදී මෙයින් විස්තර කර තිබීම. (ල. 16)

03. (i) රාමායනය, ලංකාමකාර සූත්‍රය, මහාභාරතය, දිව්‍යවදානය, රාජතරංගණිය, සීලප්පදිකාරම්, පදිරිප්පත්තු පටිතස්පාලෙයි. (ල. 3)
(ii) * ආර්යසංක්‍රමණ - ලෙන් ලිපිවල ව්‍යාප්තිය, සැස්සේරුව ලිපිය.
* ඉන්දිය ආභාෂය - මිහින්තලේ රජගල ලිපි.
* රජවරුන්/යුවරජුන්/ඇමවෙරුන්/රාජ්‍ය නිලධාරීන් පිළිබඳ තොරතුරු පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මගින් සනාථවනඅවස්ථා උදාහරණ සහිතව විස්තර වීම)(12 ගු. මා. සංග්‍රහය පිටු අංක 26) (ල. 6)
(iii) * ඉතිහාස ග්‍රන්ථයක් නොවීම.
* පැරණි තොරතුරු තුන් ආකාරයකින් සංශෝධනය කර ලියා තිබීම.
* සිදුවීම සිදුවී දීර්ඝ කාලයකට පසු රචනාකර කිරීම.
* ආගමික කරුණු වැඩිවශයෙන් සඳහන් වීම.
* කතුවරයාගේ රුචි අරුචිකම් ඇතුළත්වීම.
* සමාජ රජවරුන් පිළිබඳ අතිෂයෝක්තියෙන් විස්තර කිරීම.
* අද්භූත ජනක සිදුවීම් බහුලවීම ආදී තොරතුරු ඇතුළත් කරමින් විස්තර කර තිබීම වැදගත්. (ල. 7)

04. (i) ගල් මෙවලම්වල තාක්ෂණික වර්ධනය. (ල. 1)
(ii) * අර්ධ ශුෂ්ක කලාපයේ වෙරළාශ්‍රිත ප්‍රදේශ. (ඉරණමඩු පාංශු කලාපය)
* පහතරට තෙත් කලාපයට අයත් රත්නපුරය අවට සිටින ප්‍රදේශ. (ල. 2)
(iii) * ගල් මෙවලම් භාවිතය ක්‍රමයෙන් අතහැර ශිලා මෙවලම් භාවිතය.
* කෘෂිකර්මාන්තයට නැඹුරු වීම.
* ස්ථිරවාසීතාවය ආරම්භ වීම.
* නිවාස ඉදිකිරීම.
* ගම්මාන බිහිවීම.
* ක්‍රමවත් සුසාන ක්‍රම භාවිතය.
* පිළිස්සූ මැටි වළං භාවිතය. (ල. 4)
(iv) 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය 46 - 47 පිටුවල විස්තර වලට අනුකූලවන ලෙස පිළිතුරු සපයා තිබීම. (ල. 9)

05. උචිත. ලෙස මාතෘකාවට ගැළපෙන අයුරින් පිලිතුරු ලියා ඇත්නම් අදාළ ලකුණු ලබාදෙන්න. (ල. 8 x 2 = 16)

## C කොටස

06. * දේශපාලන බලය ක්‍රමිකව වර්ධනය වූ අයුරු විස්තර කිරීම.
* මුල්ම අවධියේ දේශපාලන බලය බෙදීගොස් (විකේන්ද්‍රගත වී) පැවති ආකාරය විස්තර කරන්න.
* විවිධ කාලවලදී පාලකයින් දේශපාලන බලය මධ්‍යගත කිරීමට ක්‍රියාකළ අයුරු විස්තර කර තිබීම.
* මුල්කාලයේදී ගෘහපති, ගමික පරුමක, පහුරුමුබ ආදී ලෙස දේශපාලන බලය ක්‍රමිකව වර්ධනය වී රාජ්‍යයත්වය වර්ධනය වූ ආකාරය විස්තර කිරීම.
* පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස, දුටුගැමුනු ආදී පාලකයින් දේශපාලන බලය මධ්‍යගත කිරීමට ගත් ක්‍රියාමාර්ග උදාහරණ සහිතව විස්තර කර තිබීම. (ල. 16)

07. (i) බුරුමය, කාලිංගය, පාණ්ඩ්‍ය, කාම්භෝජය, චෝළ දේශය. (ල. 2)
(ii) පාණ්ඩ්‍ය, බුරුමය (ල. 2)
(iii) පරාක්‍රම පාණ්ඩ්‍ය, වික්‍රම පාණ්ඩ්‍ය, ජගතිපාල (ල. 2)
(iv) * විජයබාහු රජතුමාගේ විවාහ ප්‍රතිපත්තියනිසා රාජ්‍යත්වයට කාලිංග පාණ්ඩ්‍ය රාජ වංශ උරුමකම් කීම හා ඔවුන් රාජ්‍ය බලය ලබාගැනීමට සෑම විටම උත්සාහගැනීම. එම නිසා රාජ්‍ය පාලනය දුර්වල වී මධ්‍යගත පාලනය දුර්වලවීම.
* පැරකුම් රජු විදේශීය රටවල් ආක්‍රමණය කිරීම ආර්ථික පරිහාණියට හේතු වූ බව. මීට අමතරව දුර්වල පාලකයින් බලයට පත්වීම කාලිංග මාඝ ආක්‍රමණය ආදියද පොළොන්නරු රාජධානිය බිඳවැටීමට හේතු වූ බව මාතෘකාවට පක්ෂ විපක්ෂ හා මධ්‍යස්ථ ලෙස පිළිතුරු සපයා තිබීම. (ල. 10)

08. රජරට ශිෂ්ටාචාර අවධියේදී ආර්ථිකයේ ප්‍රධාන ලක්ෂණ මාතෘකා අනුව විස්තර කර තිබීම.
* කෘෂිකර්මාන්තය හැඳින්වීම හා එහි අංශ විස්තර කරතිබීම.
* වෙළඳම හා එහි අංශ විස්තර කර තිබීම.
* මුල් යුගවලසිට පැමිනි කර්මාන්ත හා ඒවා වර්ධනය වූ ආකාරය හා ඊට බලපෑ හේතු විස්තර කර තිබීම.
(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 69-70) (ල. 16)

09. කෙටි සටහන්වල සඳහන් තොරතුරුවල ස්වභාවය හා නිවැරදිබව රචනා විශාලය හා උදාහරණ සැපයීම ආදී අංශ කෙරෙහි අවධානය යොමුකරමින් ලකුණු ලබාදෙන්න.
(ල. 8 x 2 = 16)

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440